ලිංගික අපයෝජනයන් සම්බන්ධ මාධ්‍ය වාර්තා ඔස්සේ, ඊට මුහුණ දුන් අයගේ අනන්‍යතාවය කිසිසේත්ම හෙළිදරව් නොකරන ලෙසට මාධ්‍ය මාර්ගෝපදේශයන් මගින් මාධ්‍යවේදීන්ට උපදෙස් දෙයි.
වසර 15 කට පෙර, සිය බිරිඳගේ එවකට බාලවයස්කාර නැඟණිය අපයෝජනය කළ කතරගම පුද්ගලයෙකු හට සිර දඬුවම් නියම කිරීමේ
පුවතක්, පෙබ. 17, 2023 දින අද, දිනමිණ සහ මව්බිම පුවත්පත් තුළ වාර්තා වී තිබිණි.
අද- වරදකරුගේ අනන්‍යතාවය හෙළිදරව් නොකරයි.
දිනමිණ - වරදකරුගේ අනන්‍යතාවය හෙළිදරව් කරයි.
මව්බිම - වරදකරුගේ අනන්‍යතාවය හෙළිදරව් කරයි.
(පුවත්පත් තුනෙහිම, වරදකරු සහ ලිංගික අපයෝජනයට මුහුණ දුන් අය අතර ඥාතීත්වය හෙළිදරව් කර තිබේ)
1) ලිංගික අපයෝජනයකට මුහුණ දුන් අයෙකුගේ අනන්‍යතාවය වක්‍රාකාරව හෙළිදරව් කිරීම, මාධ්‍ය ආචාර ධර්මයන්ට පටහැණි වාර්තාකරණයක් නොවන්නේද?
2) ඒ අනුව, වඩාත් යෝග්‍ය වාර්තාකරණය ලෙසින් ඔබ තෝරාගන්නේ කුමන පුවත ද?
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

